# චෞරත්වය පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණය: විචාරාත්මක අධ්‍යයනයක්

ගාල්ලේ ධම්මින්ද හිමි

සොර හෙවත් සොරා (thief) විසින් කරන කටයුත්ත 'සොරකම්' (theft, robbery) වශයෙන් හඳුනාගත හැකිය. **(Etymological Lexicon of the Sinhala Language, 2012: 314-315)**. පාලි භාෂා කෝෂග්‍රන්ථයේ 'චොරො': සොරා යන්න හඳුන්වාදීමේදී ඒ සඳහා වචන පහක් යොදා ඇත. (**Dictionary of the Pali Language, 1976: 108**).

1. Thief; සොරා
2. Robber; මංකොල්ලකාරයා
3. Bandit; චණ්ඩියා, දාමරිකයා, මංපහරන්නා, කොල්ලකාරයා,
4. Outlaw; සාහසික අපරාධකාරයා, නීතිභ්‍රෂ්ටයා
5. Felon; දුෂ්ටයා, බරපතල අපරාධකාරයා

සොරකම් කිරීම (to steal) 'චොරෙති' ලෙසත් සොරකම (theft) 'චොරිකා'[1] **(පාලි-සිංහල ශබ්දකෝෂය, 1965: 273).** ලෙසත් පාලියේ දැක්වේ. අදින්න යනු නොදුන් යන්නයි. 'අදින්නාදාන' යන පාලි වචනයෙන් ද පැහැරගැනීම හෝ යමෙකුට නොදුන් දෙයට ගිජුවීම (seizing or grasping that which is not given to one **(The Pali Text Society's Pāli-English Dictionary, 1921: 26)** යන අර්ථ දනවයි. කෙසේනමුත් නොදුන් දේ නොගැනීම ශික්ෂාපදයක් ලෙස බෞද්ධ සංස්කෘතියේ ප්‍රකටය. එපමණක් නොව, එය නිර්වාණ ප්‍රතිපදාවේ පළමු අඩියර වන සීලය රැකීම සම්පූර්ණ කිරීමක් ද වේ. **(ධම්මසිරි හිමි, 2006: 476).** අදත්තාදාන යන වචනය ද නොදුන් දේ ගැනීම වෙනුවෙන් භාවිත කෙරේ. රේරුකානේ චන්දවිමල මහනාහිමියෝ ''**බෞද්ධයාගේ අත්පොතේදි**'' මෙසේ දක්වත්.

අනුන් අයත් වස්තුවක් හිමියාට සොරෙන් හෝ ඔහු රැවටුමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ බලහත්කාරයෙන් හෝ ගැනීම අදත්තාදාන නම් වේ.

(1) අන් සතු වස්තුවක් වීමය, (2) අන් සතු වස්තුවක් බව දැනීම ය (3) පැහැර ගනු කැමති සිතය. (4) පැහැර ගැනීමට උපක්‍රම කිරීම ය. (5) වස්තුව ගැනීම යයි අදත්තාදානයේ අංග පසෙකි. මේ පඤ්චාංග යෙන් එකකුදු අඩු වුවහොත් අදත්තාදාන කර්මය සිදු නොවේ.

යම්කිසි වස්තුවක් සොර සිතින් ගත්තේ ද, එය හිමියකු නැති වස්තුවක් වේ නම් එයින් අදත්තාදාන කර්මය සිදු නොවේ. හිමියකු ඇති හිමියා විසින් නුදුන් වස්තුවක් වුව ද සොර සිතින් තොරව හිමියා කෙරෙහි විශ්වාසයෙන් ගතුයේ ද අදත්තාදාන කර්මය නොවේ. අන්සතු වස්තුවක් තමාට අයත් ය යන හැඟීමෙන් ගතුයේ ද අදත්තාදාන පාපය නොවේ **(චන්දවිමල හිමි, 2011: 57).**

රේරුකානේ නාහිමියන්ගේ කෘතියේ අදත්තාදානය සිදුකළ හැකි ආකාර විසි පහක් (25) දක්වා ඇත.[2] ඒවා ප්‍රධාන වර්ග පහකට පහ බැගින් විසිපහකි. ඒවා නම්:

1. නානා භණ්ඩ පඤ්චකය: නොයෙක් දෑ තමන් සන්තක කරගැනීම පිළිබඳ ආකාර පහකි.
2. ඒක භණ්ඩ පඤ්චකය: එක් භාණ්ඩයක් අත්පත් කර ගන්නා පස් ආකාරයකි.
3. සාහස්ථික පඤ්චකය: තම අතින් ම සොරකම් කිරීම සම්බන්ධ ක්‍රම පහකි.
4. පුබ්බපයෝග පඤ්චකය: සොරකමට කලින් උපාය යොදා කරන සොරකම් පහකි.
5. ථෙය්‍යාවහාර පඤ්චකය: අන්සතු වස්තුව හිමියාට නොපෙනෙන සේ ගැනීම හා කිරුම් මිනුම් කිරීමේදී අඩුවැඩිකොට ගැනීම **(එම: 61).**

සොරකම පිළිබඳ බෞද්ධ සමාජ දෘෂ්ටිය හා චෞරත්වය වැළැක්වීම.

ප්‍රාණඝාතය පෙරටුකොටගත් පඤ්ච අසත්පුරුෂ ලක්ෂණ පිළිබඳව **අංගුත්තරනිකායේ** සප්පුරිස සූත්‍රයේ දැක්වේ.

කතමො ච, භික්ඛවෙ, අසප්පුරිසො? ඉධ, භික්ඛවෙ, එකච්චො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති. අයං වුච්චති, භික්ඛවෙ, අසප්පුරිසො **(අ.නි. 4, සප්පුරිසසුත්ත, 2006: 414).**

ඒවා නම්:

1. ප්‍රාණඝාතය සිදුකිරීම
2. අන්සතු දේ ගැනීම
3. කාමයේ වරදවා හැසිරීම
4. මුසා දෙඩීම
5. සුරා පානය කිරීම

අංක දෙක (2) යටතේ එන කාරණාව සම්බන්ධයෙන් පමණක් අප සාකච්ඡාව දිගහැරේ. එහි අසත්පුරුෂයා (අසප්පුරිසො) හා අතිශයින් අසත්පුරුෂයාගේ (අසප්පුරිසතරො) ලක්ෂණ දැක්වීමේදී නොදුන් දේ ගන්නා තැනැත්තා: සොරා, අසත්පුරුෂයෙකු ලෙසත්, තමන් ද නොදුන් දේ නොගැනීමෙන් වෙන් නොමවී අනෙකා ද නොදුන් දේ නොගැනීමෙන් වෙන්නොම කරවන්නා අතිශයින් අසත්පුරුෂයෙකු බවත් බුදුහු වදාළහ.

කතමො ච, භික්ඛවෙ, අසප්පුරිසෙන අසප්පුරිසතරො? ඉධ, භික්ඛවෙ, එකච්චො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති; අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති; අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසුමිච්ඡාචාරෙ සමාදපෙති; අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති; අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානෙ සමාදපෙති. අයං වුච්චති, භික්ඛවෙ, අසප්පුරිසෙන අසප්පුරිසතරො **(එම).**

උක්ත සූත්‍රයේම පැනෙන පරිදි අසාධුභාව කාරණාවන්ගේ මිදුණු පුද්ගලයෝ පිළිවෙළින් සත්පුරුෂ (සප්පුරිසො) හා සත්පුරුෂභාවය අතිශයින් (සප්පුරිසතරො) ලද්දෝ වෙති.

කතමො ච, භික්ඛවෙ, සප්පුරිසො? ඉධ, භික්ඛවෙ, එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. අයං වුච්චති, භික්ඛවෙ, සප්පුරිසො **(එම).**

කතමො ච, භික්ඛවෙ, සප්පුරිසෙන සප්පුරිසතරො? ඉධ, භික්ඛවෙ, එකච්චො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති; අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති; අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති; අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති, පරඤ්ච මුසාවාදා වෙරමණියා සමාදපෙති; අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති. අයං වුච්චති, භික්ඛවෙ, සප්පුරිසෙන සප්පුරිසතරොති **(එම).**

මෙම දේශනයෙන් පැහැදිලි වන්නේ, යමෙකුගේ අසත්පුරුෂභාවය සඳහා ඔහුගේ අධම ක්‍රියාවන් කෙතරම් බලපාන්නේ ද යන්නයි. තවද ඒ අතුරෙන් සොරකම ඈ අසම්මත සමාජ ක්‍රියාවන් කෙතෙක්දුරට බුදුසමය ප්‍රතික්ෂේප කරන්නේද යන්නයි. එහිම පැනෙන යථාර්ථය නම් සප්පුරිසතර නමැති වඩා ප්‍රශස්ත පුද්ගලයෙකු නිර්මාණයවීමට නම් සොරකම ඈ විෂම චර්යා බැහැරකළ යුතුය යන්නයි.

මංකොල්ලකරුවෙකු (Highwayman) උපමාකරගෙන භික්ෂූන් උදෙසා දේශනා කරන ලද මහාචොර සූත්‍රය, සොරෙකු සතු දුර්ලක්ෂණ පහක් දක්වයි. එනම්:

''ඉධ, භික්ඛවෙ, මහාචොරො විසමනිස්සිතො ච හොති, ගහනනිස්සිතො ච හොති, බලවනිස්සිතො ච හොති. භොගචාගී ච හොති. එකචාරී ච හොති'' **(මහාචොරසුත්ත, අ.නි. 3, 2006: 204).**

1. විෂමනිඃශ්‍රිතය (inaccessible) : ළඟාවිය නොහැකි ස්ථානවල සැඟවේ

2. ගහනනිඃශ්‍රිතය (density) : කැළෑවල සැඟවේ
3. බලවන්නිඃශ්‍රිතය (behind the powerful) : බලවතුන්ගේ ඇසුර නිසා ලත් බලය
4. භෝගචාගී (wealthy) : සම්පත් ඇත්තෙකු වීම
5. ඒකචාරී (behaves alone) : තනිව හැසිරේ

මෙම ලක්ෂණ අතුරින් අංක 1, 3, 4 නූතන සොරුන් සම්බන්ධයෙන් වඩාත් ම අදාළවේ. විවිධ විෂම චර්යාවලින් මුදල් උපයා නීතියෙන් වැරදිකරුවෙකු වූ විට විදෙස්ගතවීම, මුහුණේ හැඩය, නම, පෙළපත, හෝ පදිංචිය වෙනස්කොට සැඟව සිටීම ජාතික හා ජාත්‍යන්තර සොරුන්ගේ සුලබ ලක්ෂණයක් වී ඇත. අංක 3හි දක්වෙන පරිදි ජාතික හා ජාත්‍යන්තර බලවතුන්ගේ පිහිටපැතීම හා රැකවරණය හිමිකරගැනීම ද වර්තමානයේ කැපීපෙනෙන ලක්ෂණවලින් එකකි. බොහෝවිට ඔවුන්ට එදිරිව නීතිය ක්‍රියාත්මකවීම පවා සිදු නොවේ. ලොව බොහෝ අපරාධකරුවෝ ධනවත්තු වෙති. ධනවතුන් අපරාධකරුවන් ව සිටින අවස්ථාද දුලබ නොවේ. සූත්‍රයේ පැනෙන සොරා සාමාන්‍ය සොරෙකු නොව බලවත් එකෙකි. නූතන ලෝකයේ සොරුන් වස්ත්‍රයෙන් හඳුනාගත නොහැකිය. ඔවුන් සුදු කරපටි අපරාධකරුවන් (white collar criminals) වශයෙන් හඳුන්වන්නේ එහෙයිනි.

සූත්‍රය වැඩි දුරටත් දක්වන්නේ, පාපී භික්ෂුවද මංකොල්ලකරුවෙකු සදිසි දුර්ලක්ෂණ දරා සිටින බවයි. ''එවමෙවං බො, භික්ඛවෙ, තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපිභික්ඛු,'' **(එම: 206).** එම පව්ටු භික්ෂුව සතු විෂම හැසිරීම් උක්ත උපහැරණයට සමගාමීව පහත පරිදිය.

1. විෂම කාය, වාක් හා මනෝ කර්මයෙක් සමන්විතවීමඃ විෂමනිඃශ්‍රිත නම් වේ.
2. ශාස්වත හා උච්ඡේද දෘෂ්ටි දැරීමඃ ගහනනිඃශ්‍රිත නම් වේ.
3. රජ මැතිඳුන්ගෙන් ලැබෙන රැකවරණයඃ බලවන්තනිඃශ්‍රිත නම් වේ.

4. අතිමහත් සිව්පස පරිභෝජනයඃ භෝගචාගී නම් වේ.

5. සිව්පස පරිභෝජනයට ඇති රුචිය නිසා හුදෙකලාවීමඃ ඒකචාරී නම් වේ.

**අංගුත්තරනිකායේ** චොරඞ්ග සූත්‍රයේ මහසොරෙකුට හිමි අංග අටක් දක්වයි. එනම්ඃ

අප්පහරන්තස්ස පහරති, අනවසෙසං ආදියති, ඉත්ථිං හනති, කුමාරිං දූසෙති, පබ්බජිතං විලුම්පති, රාජකොසං විලුම්පති, අච්චාසන්නෙ කම්මං කරොති, න ච නිධානකුසලො හොති **(මහාචොරඞ්ගසුත්ත, අ.නි. 5, 2006ඃ 346).**

1. පහර නොදෙන්නවුන්ට පහරදෙයි
2. ඉතිරිනොකර ගෙනයයි
3. ගැහැනුන් මරයි
4. තරුණියන් දූෂණය කරයි
5. පැවිද්දාගෙන් සොරකම් කරයි
6. භාණ්ඩාගාරයෙන් සොරකම් කරයි
7. ඉතා කිට්ටුව කටයුතු කරයි
8. සැඟ වූ ධනයෙහි දක්ෂ නොවේ

සූත්‍රයෙන් සුභාවිත ධර්ම විවරණය වන්නේ, එවැනි දුර්ලක්ෂණ දරන සොරෙකුට වුවද දිගු පැවැත්මක් නොමැති බවත් වහා සොරාගේ කාර්ය අවසන් (does not do it long, ends up quickly) වන බවයි. ලෝකයේ අන්සතු දේවල්වලට ගිජුකම් කරන්නෝ බහුලය. එයින් වැළකුණු අය මදය. ''අප්පකා තෙ සත්තා යෙ අදින්නාදානා පටිවිරතා. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ අදින්නාදානා අප්පටිවිරතා'' **(අදින්නාදානසුත්ත, ස.නි. 5-2, 2006ඃ 338).** තමා විසින් ම සොරකම් කිරීම, තවෙකෙක් ඒ සඳහා යෙදවීම, සොරකමට අනුබල දීම හා සොරකමේ ගුණ දකින්නා යන සිව්පිරිස ම අපාගාමී වන බව බුදුසමය උගන්වයි.

චතුහි, භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො යථාභූතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චතුහි? අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති, අදින්නාදානස්ස ච වණ්ණං භාසති **(අදින්නාදානසුත්ත, අ.නි. 2, 2006: 486).**

නූතනයේ සොරකමට අනුබල දීම (approving, taking the not given) බහුලව දැකිය හැකිය. බුදුසමය අවධාරණය කරන්නේ, ඔවුන් තිර වශයෙන්: ගෙනවුත් බහා තැබූයේ යම්සේ ද (යථාභූතං නික්ඛිත්තො) නිරයට පැමිණෙන බවයි.

සොරකම සම්බන්ධයෙන් අදත්තාදාන පාරාජිකාපත්තිය විස්තර කිරීමේදී වටිනා විග්‍රහයක් හමුවේ. කුම්භකාරපුත්‍ර ධනිය හිමියන්ගෙන් අදත්තාදානය ගැන ඇසූ බුදුරදුන් උන්වහන්සේ තම වැරැද්ද පිළිගැනීමෙන් පසුව දුන් අවවාදය, සොරකම කෙතෙක්දුරට බුදුසමය ප්‍රතික්ෂේප කරන්නේද යන්නට කදිම නිදසුනකි.

''අනනුච්ඡවිකං, මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං'' **(පාරාජිකපාළි, 2006: 102).** මෙහිදී බුදුහු කරුණු සයකින් සොරකම ප්‍රතික්ෂේප කරති.

1. නුසුදුසු වූවකි (It is not fit)
2. අනුලෝම නූවකි (It is not seemly)
3. නොගැළපේ (It is not becoming)
4. පැවිද්දට නොගැළපේ (It is not worthy of a recluse)
5. කැප නොවූවකි (It is not proper)
6. නොකටයුත්තකි (It is not to be done)

තවද සොරකම් කිරීමේ යොදාගනු ලබන උපක්‍රම 30ක් පිළිබඳව දෙවන පාරාජිකාපත්තියේ දැක්වේ. වැඩි කරුණාකර වැඩි විස්තර සඳහා අදාළ මූලාශ්‍රය බලනු මැනවි. මේ මේ ආකාරයේ සොරකම් බුදුසමය ප්‍රතික්ෂේප කර ඇති අයුරු මතුකර දැක්වීම උදෙසා එම උපක්‍රම පමණක් මෙහි දක්වනු ලැබේ.

1. භූමට්ඨං: බිම පිහිටි යමක් ගැනීම (being in the earth)
2. ථලට්ඨං: ගොඩබිමේ ඇති යමක් ගැනීම (being on firm ground)
3. ආකාසට්ඨං: අහසෙහි ඇති යමක් ගැනීම (being in the air)
4. වෙහාසට්ඨං: හිස්තැන පිහිටි යමක් ගැනීම (being above ground)
5. උදකට්ඨං: ජලයෙහි පිහිටි යමක් ගැනීම (being in the water)
6. නාවට්ඨං: නැවකින් යමක් ගැනීම (being in a boat)
7. යානට්ඨං: වාහනයකින් යමක් ගැනීම (being in a vehicle)
8. භාරට්ඨං: ගෙනයන බරක ඇති යමක් ගැනීම (carried as a burden)
9. ආරාමට්ඨං: ආරාමෙන් ගැනීම (being in a park)
10. විහාරට්ඨං: විහාරෙන් ගැනීම (being in a vihāra)
11. ඛෙත්තට්ඨං: කුඹුරෙන් ගැනීම (being in a field)
12. වත්ථුට්ඨං: දේපල ගැනීම (being on a property)
13. ගාමට්ඨං: ගමෙන් යමක් ගැනීම (being in a village)
14. අරඤ්ඤට්ඨං: කැලයෙන් යමක් ගැනීම (being in a jungle)
15. උදකං: ජලය සොරකම් කිරීම (water)
16. දන්තපොනං: දැහැටි සොරකම් කිරීම (tooth-cleaner)
17. වනප්පති: මිනිසුන් විසින් පරිගෘහිත ගසක් කැපීම (forest tree)
18. හරණකං: අනෙකෙකු වෙනුවෙන් රැගෙන යන බඩුවක් සොරකම් කිරීම (goods in transit)
19. උපනිධි: මතුවට ගනු පිණිස රැකීමට තැබූ බඩුවක් ගැනීම (deposit)

20. සුඞ්කඝාතං: රජයට අයත් යමක් සොරකම් කිරීම (customs-frontier)
21. පාණො: මනුෂ්‍ය ප්‍රාණියෙකු සොරකම් කිරීම (a creature)
22. අපදං: දෙපා නැත්තෙකු සොරකම් කිරීම; සර්පයා, මත්ස්‍යයා (a creature without feet)
23. ද්විපදං: දෙපා ඇත්තවුන් සොරකම් කිරීම; මිනිසුන්, පක්ෂීන් (two-footed)
24. චතුප්පදං: සිව්පාවුන් සොරකම් කිරීම; ඇත්, අස්, ඔටු, ගව, කොටලු (four-footed)
25. බහුප්පදං: බොහෝ පා ඇති සතුන් සොරකම් කිරීම; ගෝනුස්සා, පත්තෑයා (many-footed creatures)
26. ඔචරකො: යම් භාණ්ඩයක් වෙනුවෙන් ඔත්තු බලා සොරකම් කිරීම (a spy)
27. ඔණිරක්ඛො: අනෙකෙකු ගෙනවුත් තැබූ භාණ්ඩයක් ගැනීම (the keeper of entrusted wares)
28. සංවිදාවහාරො: සංවිධානාත්මක සොරකම (an arranged theft)
29. සඞ්කෙතකම්මං: සලකුණු මාර්ගයෙන් සොරකම් කිරීම (making of a rendezvous)
30. නිමිත්තකම්මන්ති: සංඥා මගින් සොරකම් කිරීම (the making of a sign)

එපමණක් නොව සොරකම් පිළිබඳ වඩාත් දාර්ශනික එළඹුම නම්, සොරකම යන වරදට අසුනොවන අවස්ථා කීපයක් ද පාරාජිකපාළිය අවධාරණය කිරීමයි.

අනාපත්ති සසඤ්ඤිස්ස, විස්සාසග්ගාහෙ, තාවකාලිකෙ, පෙතපරිග්ගහෙ, තිරච්ඡානගතපරිග්ගහෙ, පංසුකූලසඤ්ඤිස්ස, උම්මත්තකස්ස, (ඛිත්තචිත්තස්ස වෙදනාට්ටස්ස) (ඛිත්තචිත්තස්ස වෙදනාට්ටස්ස) කත්ථචි නත්ථි ආදිකම්මිකස්සාති (එම: 124).

පහත සඳහන් අවස්ථාවලදී හෝ මානසික තත්ත්වවලදී සොරකමක් කිසිවිටෙකවත් සිදුනොවේ.

1. තමාට අයත්යැයි දන්නාවිට
2. විශ්වාසය ඇති කල්හි
3. කෙටි කලකට ගත්විට
4. ප්‍රේතයන්ට අයත් දේ
5. තිරිසනුන් සතු දේ
6. පංසුකූල සංඥාවෙන් ගත්විට
7. උන්මත්තකයාට
8. සිහිවිකල් අයෙකුට
9. කිසියම් වේදනාවකින් පෙළෙන්නෙකුට
10. ආදිකම්මිකයාට

**මජ්ඣිමනිකායේ** සම්මාදිට්ඨි සූත්‍රයට අනුව අදත්තාදානය අකුසලයකිඃ ,අදින්නාදානං අකුසලං, **(සම්මාදිට්ඨිසුත්ත, ම.නි. 1, 2006ඃ 110).** එයින් වැළකීම කුසලයකිඃ අදින්නාදානා වෙරමණී කුසලං, එමඃ 112). **දීඝනිකායික** කූටදන්ත සූත්‍රයේ එන මහාවිජිතරාජ පුරාණ කථාවට (Mythical story) අනුව සොරුන්ගෙන් ගහණ රාජ්‍යයක සටහනක් හමුවේ.

''භොතො ඛො රඤ්ඤො ජනපදො සකණ්ටකො සඋප්පීළො, ගාමඝාතාපි දිස්සන්ති, නිගමඝාතාපි දිස්සන්ති, නගරඝාතාපි දිස්සන්ති, පන්ථදුහනාපි දිස්සන්ති'' **(කූටදන්තසුත්ත, දී.නි. 1, 2006ඃ 262).**

එහි ගම් පැහැරගැනීම්, නියම්ගම් පැහැරගැනීම්, නුවර පැහැරගැනීම්, මං පැහැරීම් ආදිය බහුලය. එසේම මෙම රට සොර උවදුරුවලින් සහිතය. (country is beset by thieves) මෙවැනි පසුබිමක් යටතේ රජුගේ ආධ්‍යාශය වන්නේ, මහායඥයක් සිදුකිරීමයි. එසේවුවත් පුරෝහිත රජුගේ අදහසට විරුද්ධ විය. තවද පුරෝහිත

පැහැදිලි කරන්නේ, මෙවැනි පසුබිමක් යටතේ අයබදු එකතුකිරීම පවා නොකළ යුතු බවයි. නූතනයේ ජනාධිපති, අගමැති හෝ කාර්යමණ්ඩල ප්‍රධානි වැනි තනතුරකට සමානව පුරාණයේ එන පුරෝහිතගේ භූමිකාව පිළිබඳ අවබෝධ කරගත යුතුය. හෙතෙම යාගය වෙනුවට නවෝත්පාදන යෝජනා තුනක් (03) ඉදිරිපත් කළේය.

තෙන හි භවං රාජා යෙ හොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති කසිගොරක්ඛෙ, තෙසං භවං රාජා බීජභත්තං අනුප්පදෙතු. යෙ හොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති වාණිජ්ජාය, තෙසං භවං රාජා පාභතං අනුප්පදෙතු. යෙ හොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති රාජපොරිසෙ, තෙසං භවං රාජා භත්තවෙතනං පකප්පෙතු **(එම).**

1. ගොවියන් වෙනුවෙන් ධාන්‍ය, බීජ (grain & fodder) බෙදා දීම
2. වෙළෙන්දන් වෙනුවෙන් ප්‍රාග්ධනය (capital) ලබාදීම
3. රාජයේ සේවකයන් සඳහා බත්, වැටුප් (living wages) ලබාදීම

මෙම නව ක්‍රමෝපාය තුන (03) ක්‍රියාවට නැංවූ ‘මහාවිජිත රාජ්‍ය’ ශීඝ්‍ර සංවර්ධනයකට පත්වුණි. සොරමුල (දස්සුඛීලො) මුලිනුපුටා දැමුණි. රට ධනයෙන් ආඪ්‍ය විය. ජනපද සොරබියෙන් නොමිරිකුණි. ජනතාව තුටු වූහ. එකිනෙකා කෙරෙහි විශ්වාසය ගොඩනැගුණි.

තෙ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤො ජනපදං න විහෙඨිංසු, මහා ච රඤ්ඤො රාසිකො අහොසි. ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුප්පීළා මනුස්සා මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරිංසු **(එමඃ 264).**

අතිශයින් සංකීර්ණ සමාජ තත්ත්වයකදී වුව ද පුරෝහිතගේ සබුද්ධික හැසිරීම අගය කළ යුතුය. යම් රටක සාර්ථකත්වය පවතින්නේ, එම රටේ පාලකයාගේ කාර්යාකාර්ය මත පමණක් නොව, රටේ ප්‍රධානියාට උපදෙස් දෙන්නන්ගේ භූමිකාව ද ඒ සඳහා සැලකිය යුතු මට්ටමක පැවතිය යුතුය යන්නට කදිම උදාහරණයකි මේ.

**විවරණය**

බුදුසමය සොරකම කිසි අයුරකින්වත් අනුමත නොකරයි. බුද්ධවචනයෙන් ඒ සඳහා කිසිදු අවකාශයක් හිමි නොවේ. බෞද්ධ සමාජය පඤ්චසීල ප්‍රතිපදාවෙන් පෝෂණය වී ඇත්තේ, නොදුන් දේ නොගැනීම යන ආත්ම විශ්වාස ද ඒ අතර වේ. සොරකම පිළිබඳ නූතන විචාර ඒ ඒ රටවල නීති-අණපනත්වලට අනුගතව අර්ථකථනය කර ඇත. උදාහරණ ලෙස, ඔබ "Theft" යනුවෙන් අන්තර්ජාලයේ සොයයි නම්, ඔබට විවිධ රටවල නීතිප්‍රකාර (by jurisdiction) සොරකම් පිළිබඳ පහසුවෙන් සොයාගත හැකිය. විකිපීඩියා වෙබ් පිටුව දක්වන පරිදි සොරකම් වර්ග කීහිපයකි. ගෙවල් බිඳීම (burglary), මූල්‍ය වංචාව (embezzlement), පෞද්ගලික දේපොල හෝ ව්‍යාපාර සොරකම (larceny), පැහැරගැනීම (looting), මංකොල්ලය (robbery), සාප්පු සොරකම (shoplifting), පොත් සොරකම (library theft/ fraud) ඒ අතුරන් කිහිපයකි.[3] නූතනයේ පොත් සොරකම (library theft/fraud) අභිබවමින් රචනා චෞරත්වය (plagiarism) පිළිබඳව සාකච්ඡා කිරීමට තරම් ශාස්ත්‍රීය ලෝකයේ පවා සොරුන් බිහිවී ඇත. මේ කුමන වර්ගයේ සොරකමක් වුව ද අකුසලයකි. සොරසිතින් යම් භාණ්ඩයක් අදාළ තැනින් තවත් තැනක තැබීම (ඨානා චාවෙති, අපත්ති පාරාජිකස්ස) පවා පාරාජිකා වීමට හේතුවන බැව් කීමෙන් සොරකමේ විපුලත්වය මැන බැලිය හැකිය.

**ආන්තික සටහන්**

1 පුරුෂ ලිංගාර්ථයෙන් සොරාව හැඳින්වීමටද යෙදේ.

2 ලේඛනයේ දී 1965, දීර්ඝ බව වළක්වාගැනීම උදෙසා පස්විසි ආකාරය විස්තාරිතව මෙහි නොදැක්වේ. වැඩි දුර කියවීමටඃ බෞද්ධයාගේ අත්පොත, 57-63 පිටු.

3 වැඩි විස්තර සඳහා බලන්නඃ https://en.wikipedia.org/wiki/Theft, retrieved: 17 August, 2020.

## ආශ්‍රිත ග්‍රන්ථ

### කෝෂ-ග්‍රන්ථ

**Dictionary of the Pali Language**. (1976). Childers, R.C. Kyoto: Rinsen book Company.

**Etymological Lexicon of the Sinhala Language**. (2012). Vol. 1, Karunatilake, W.S. Colombo: S. Godage Brothers (Pvt) Ltd.

**The Pali Text Society's Pāli-English Dictionary.** (1921). Davids, Rhys, T.W. and Stede, William. London: PTS.

**පාලි-සිංහල ශබ්දකෝෂය**, (1965). සිරි සුමංගල හිමි, මඬිතියවෙල. කර්තෘ ප්‍රකාශන.

ධම්මසිරි හිමි, කන්දරපංගුවේ. 2006. **උපග්‍රන්ථ සහිත සංඛ්‍යා ධර්මපද වර්ණනා**, මොණරාගල: සිරි පියරතන පිරිවෙණ.

### ත්‍රිපිටක මූලාශ්‍රය

**අ.නි.** 2. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**අ.නි.** 3. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**අ.නි.** 4. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**අ.නි.** 5. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**දී.නි.** 1. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**ම.නි.** 1. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**විනය-පිටකය.** පාරාජිකපාළි. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

**ස.නි.** 5-2. 2006. කොළඹ: බුද්ධ ජයන්ති මුද්‍රණ.

### ද්විතීයික මූලාශ්‍රය

චන්දවිමල හිමි, රේරුකානේ. (2011). **බෞද්ධයාගේ අත්පොත**, පොකුණුවිට: ශ්‍රී චන්දවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය.

### විද්‍යුත් මූලාශ්‍රය

https://en.wikipedia.org/wiki/Theft, retrieved: 17 August, 2020.

# කාව්‍යය සමාරම්භයː භාරතීය හා බෞද්ධ මතවාද සමාලෝචනය

ඇහැලේපොල මහින්ද හිමි

## ප්‍රවේශය

මානවයා සතු සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක චින්තාවලිය හා ඒ සමග බැඳුණු ඥාන සම්ප්‍රදාය ද කාව්‍ය යනුවෙන් සැලකේ. ගීතය සහ කවිය ශබ්ද රසයේත් අර්ථ රසයේත් සංකලනයෙකි. ගීතය කවියෙහි ම අනුකොටසකි. කාව්‍ය සංකල්පය මානවයාගේ ආදිතම අවස්ථාවේ සිට පැවත එන්නකි. කිසියම් ආගමකට, ජාතියකට, ප්‍රදේශයකට, භාෂාවකට හා කුලයකට සීමා නොවන සමස්ත මානව ප්‍රජාව මෙන්ම ඇතැම් සත්ත්ව කොටස් ද කාව්‍යයට සංවේදී වන නිසා කාව්‍ය යනු විශ්ව සාධාරණ වින්දනීය අත්දැකීමක් සේ ගිණිය හැකිය. විරාගී චින්තනය සහ චරණය මඟින් සංසාර විමුක්තිය සාක්ෂාත් කරගැනීමට මඟ පෙන්වන දර්ශනයක් වන බුදුදහමෙහි ඇතුළත් කාව්‍යයෙහි සමාරම්භය පිළිබඳ විග්‍රහය මෙහිදී සංක්ෂිප්ත ව විමර්ශනය කෙරේ. භාරතීය කාව්‍යවිචාර ධාරාව තුළ කාව්‍ය සංකල්පය මූලික ව හඳුන්වා දී ඇති ආකාරය සහ පිටකාගත කාව්‍ය සංකල්පනා පිළිබඳ ව මෙහි දී වැඩිදුරටත් සාකච්ඡා කර ඇත. කාව්‍යකරණය පෙර නොවූවිරූ නොදුටුවිරූ අපූරු වස්තු ප්‍රතිනිර්මාණය කිරීමේ විශ්ව ශක්තියක් බඳු ය. සෑම පුද්ගලයෙකුට ම කවීත්ත්වය පිහිටන දෙයක් නො වේ. සඵලවත් සහ ගුණාත්මක කාව්‍යයක් නිර්මාණය කිරීම සඳහා නිර්මාණකරුවා සතු විය යුතු ධර්මතා කාව්‍ය සම්පත්තිය සේ ගැණෙන අතර ගුණාත්මක කාව්‍යයකින් අභිමත ආස්වාදයේ හරය කාව්‍යයේ අභිමතාර්ථය වේ. කාව්‍යය යනු සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි ලා ජනප්‍රියතම සාහිත්‍යාංගය යි. භාරතීය කාව්‍යවිචාරයෙහි පුළුල් පරාසයක විහිදුණු කාව්‍ය ප්‍රභේද ඇති අතර බෞද්ධ කාව්‍ය සම්ප්‍රදායෙහි ශ්‍රව්‍ය කාව්‍ය පිළිබඳ ව පමණක් සාකච්ඡා කර ඇත.